
ප්‍රයිම් ග්‍රාමීන්

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

4 කාණ්ඩය - පළමුවන කලාපය - 2015 ජූනි



නිරූපනය : පාතිමා සාරා මහත්මිය

ප්‍රයිම් ග්‍රාමීන් නාවලපිටිය ශාඛාවේ සාමාජිකා

ඡායාරූප : ලක්ෂමන් කුමාරතුංග

HNB "Prime Grameen is a subsidiary of Hatton National Bank PLC"





ජීවිතයට අරුතක්

# ඔබ කාර්යාලයේ වැඩ පහසුවට ක්‍රමවිධි 18ක්

සමහර විට ඔබ ඉතා වැඩ අධික අයකු විය හැකියි. ඒ නිසාම ඔබගේ කාර්යාලයේ සමහර වැඩ අතපසුවීම්, මඟහැරීම් සිදුවිය හැක. වැඩ අතපසුවීම්, මඟහැරීම් සිදුනොවී නිසි ලෙස ඔබ රාජකාරි කාලය කළමනාකරණය කරගැනීමෙන් ඔබ රාජකාරි කටයුතු වඩාත් පහසු හා ඵලදායි වෙනවා ඇත. ඔබගේ කාර්යාලයේ වැඩ කරන වේලාවට ඔබේ කාලය අනිසි ලෙස නාස්ති වෙනවාද? එම නාස්තින් අවම කර ගැනීමට ඔබ කුමන ආකාරයේ ක්‍රම විධි දැනට පාවිච්චි කරනවාද? ඔබ කාර්යාලය ක්‍රමානුකූල කර ගැනීමට ලොකු සැලසුම් විශාල දින ගණන් අවශ්‍ය නැත. ඒ සඳහා දිනකට සුළු මිනිත්තු ප්‍රමාණයක් වෙන් කර ගැනීම ප්‍රමාණවත්ය.

**ඔබ මේසය, කාර්යාලය සංවිධානය කරගැනීම හෙටට කල් නොදමන්න. දැන්මම ක්‍රියාත්මක වන්න. පහත ක්‍රමවිධීන් අනුගමනය කිරීමෙන් ඔබ කාර්යාලය කාර්යක්ෂම හා ඵලදායී ආයතනයක් කර ගැනීමට ඉඩකඩ ලැබෙනවා ඇත.**

1. ඔබ ලාච්චුව, ඔබ මේසය ඔබ කාර්යාලය දෙස ඉතා දැඩි අවධානයෙන් බලා එම ස්ථාන වල ඇති අනවශ්‍ය දේ පිළිබඳ අවධානය වහාම යොමු කරන්න. එසේ අවධානය යොමු කර ඔබට හෝ කාර්යාලයට අවශ්‍ය නැති දෑ තිබේනම් ඒවා ලේඛනයකට ගෙන වහාම ඉවත් කිරීමට කටයුතු කරන්න. ඔබගේ අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය නිසි ස්ථාන වල තැබීමට සැලකිලිමත් වන්න. එමගින් ඔබට ඔබගේ උපකරණ සෙවීමේ කාලය අවම කර ගත හැකි වෙනවා ඇත. එය ඔබගේ මානසික සුවයට ද හේතුවේ.
2. ඔබ නිතිපතා හා පාවිච්චි කරන දෑ හඳුනාගෙන ළඟින්ම තබා ගන්න. ඉඳහිට අවශ්‍ය වනදෑ ඔබ සාමාන්‍යයෙන් ඉවත් කර වෙනමම ස්ථානයක තබන්න. උදාහරණ ලෙස නිතිපතා ඔබට ස්ටේප්ලර් මැසිම අවශ්‍යවේනම් ඔබ ළඟින්ම තබාගන්න. පන්චරය ඔබට මසකට වරක් පමණ අවශ්‍ය වේ නම් වෙනත් පොදු ස්ථානයක තබා ගන්න.
3. ඔබ කාර්යාලයේ පවතින දෑ ලේබල් කරන්න. එමගින් පහසුවෙන් හඳුනාගැනීමට ඉඩකඩ ලැබේ. උදාහරණ ලෙස ඔබගේ ෆයිලින් කැබිනට් එකේ ඇති ෆයිල් මොනවාද යන්න හඳුනාගැනීමට අංක යොදා සැමට පෙනෙන ලෙස ලේබල් කරන්න.
4. ඔබගේ කබඩ්වල ඇති ෆයිල් අඩුකර හැකි පමණ ඉලෙක්ට්‍රොනික ෆයිල් පාවිච්චියට යොමුවන්න.

| | කාර්යය | වේලාව සිට දක්වා | කළා | නැත |
|---|---|---|---|---|
| 01 | කෙටි රැස්වීමක් පැවැත්වීම | 8.30-8.45 | | |
| 02 | පාරිභෝගිකයින්ට දුරකථන ඇමතුම් ලබා දීම | 8.45-10.15 | | |
| 03 | | | | |
| 04 | | | | |

5. සෑම අයෙකුම තමාගේ වැඩ කරන දවස සඳහා ඊට කලින් දින විනාඩි පහක් වෙන්කර Things to do list එකක් සකසා ගන්න.

   මෙලෙස ඔබ දිනපතා සැලසුමක් සෑදීමෙන් ඔබ කාලය ඵලදායි ලෙස යොදා ගැනීමට හැකිවෙනවා ඇත.
6. නොකෙරී ඇති වැඩ ලැයිස්තුවක් සාදා දිනපතා ඒවා වහාම අවසන් කිරීමට කටයුතු කරන්න.
7. ඔබගේ පරිගණකයේ ඇති ෆයිල්ස් නිසි ලෙස සංවිධානය කරගන්න. අනවශ්‍ය ෆයිල් තිබේ නම් මකා දැමීමට හෝ බාහිරව තැන්පත් කළ හැකි ස්ථානයක එම තොරතුරු ගබඩා කර තබන්න.
8. ඔබ මේසයේ ලාච්චුව ඉතා චමත්කාර ලෙස පවත්වාගෙන යන්න. අනවශ්‍ය දේ පවතී නම් වහාම ඉවත්කර දමන්න.
9. ඔබට දිනපතා ලැබෙන E-mail පණිවිඩ බැලීමට දිනකට වාර දෙකක් පමණක් වෙන් කර ගන්න. එය උදේ හා හවස ලෙස සැලසුම් කර ගන්න. හැකි ඉක්මනින් අදාල E-mail පරීක්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්න.
10. ඔබගේ ලිපි ලේඛන නීතිමය වශයෙන් තබාගත යුතු දිනවකවානු හඳුනාගෙන ඒ මත ඔබගේ ෆයිල් හා ලිපි ලේඛන සැලසුම් කර ගන්න.
11. පැරණි ලිපි ලේඛන වහාම ඉවත් කරන ක්‍රමවේදයක් ආයතනය තුළ ඇති කර ගන්න.
12. කාර්යාලය තුළ පැරණි පුවත් පත් සඟරා තිබේ නම් වහාම ඉවත් කිරීමට කටයුතු කරන්න.
13. ඔබගේ වෘත්තීය දියුණුවට අදාලව පරිඝණකයේ වෙනමම ෆෝල්ඩර් (Folder) එකක් විවෘත කරගෙන තම දැනුම එකතු කර අධ්‍යයනය කරන්න.
14. දවස අවසානයේ ඔබ සැලසුම් කළ වැඩ සිදුවුයේ දැයි පසු විපරම් කර බලා නොකෙරුන වැඩ ඊළඟ දවසේ දී අවසන් කිරීමට කටයුතු කරන්න.
15. සෑම ලේඛනයක්ම ලිපියක්ම සතියකට වරක්වත් ෆයිල් කර තැබීමට කටයුතු කරන්න.
16. දිනපතා ඔබගේ රාජකාරි කටයුතුවල ඉතා වැදගත් වැඩ, වැදගත් වැඩ, වැදගත් නොවන වැඩ මොනවාදැයි හඳුනාගෙන ඔබ දවස ඒ මත ප්‍රමුඛතාවය ලබා දෙන්න.
17. රාජකාරි කටයුතු කරන අතරතුර සෑම පැයකටම අවම වශයෙන් විනාඩි 5 ක වත් විවේකයක් ලබා ගෙන මනස සැහැල්ලු කර ගන්න.
18. දවසේ ගෙවන සෑම මොහොතකම සතුටින් සිනහවෙන් සිටීමට කටයුතු කරන්න. එමඟින් ඔබට සහ කාර්යාලයේ සෑම දෙනාටම සමඟියෙන් හා සහයෝගයෙන් කටයුතු කිරීමට හැකිවනවා ඇත.

ඔබත් අද සිටම මෙම ක්‍රම ශිල්ප 18 ඔබ ජීවිතයට ඇතුලත් කරගැනීමට කටයුතු කරන්න. එවිට ඔබට මෙන්ම ඔබ කාර්යාලයේ ද ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකි වෙනවා නොඅනුමානය❑



ආචාර්ය **ප්‍රේමසිරි ගමගේ**
සභාපති - ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය

**අනුන්ගේ දියුණුව දැක සතුටු වීමෙන් තමාද දියුණුවට පත්වේ.**

# ජීවිතේ කලින් දවසට වඩා පියවරක් හරි ඉදිරියට තියන්නයි මට ඕන වුණේ....

## ග්‍රාමීන් ශක්තියයි ඇගේ දිරියයි



අජන්තා කුසුමලතා,
සාමාජිකා, නාවලපිටිය ශාඛාව

"කුසුමලතාලෑ අම්මේ.... අර දුවට මහපු ගවුම නම් හරිම අගෙයි.... ඇඟට තියලා මැහුවා වගේ....''

''මොන ගවුමද.... අනේ මට ඒ වැඩේ තවම ඉවරකර ගන්න බැරි වුණ හින්දා උඹ මට ඔලොක්කුවට කතා කරනවා නේද.... හිටිං මං ඒක ඉක්මනින් මහලා දෙන්නම්....'' අම්මාගේත් සීලවතී නැන්දාගේත් කතාව කුඩා කුසුමලතා අසා සිටියේ ගැහෙන හදවතිනි . සීලවතී නැන්දාගේ දුවගේ ගවුම මසා දුන්නේ තමා යැයි කීවොත් වෙන්නේ අම්මාගෙන් ගුටි කන්නටය.... මම කියලා තියෙනවා නේද අනුන්ගේ රෙදි වලින් පුරුදු වෙන්න වැඩ කරන්න එපා කියලා. රෙදි නාස්තිකළාම කවුද ඒ අලාභේ ගෙවන්නේ.... කුසුම ලතාගේ කනෙන් ඇද කලින් වතාවක අම්මා තරවටු කළ අයුරු සිහිවී කුසුමලතාගේ අත කණ කරා ගියේ ඇයටත් නොදැනීමය. තවමත් ඒ කණ පුපුරු ගසනවා වාගේය.

යාන්තම් වයස අවුරුදු 13 සිට අම්මාට හොරෙන් අම්මාට ලැබෙන ඇනවුම් වලට හෝ අම්මාට නොදන්වා ලබා ගත් ඇනවුම් වලට අනුව රෙදි කපා ඇදුම් මැසීමට අජන්තා කුසුමලතාට තිබූ බුහුටි බව අම්මා තුළ ඉපැද්දුවේ දුව කෙරෙහි ආඩම්බරයකි. තම පාසැලෙහි එදිනෙදා වියදම සඳහා කුසුමලතා මුදල් හොයාගත්තේ ඇඳුම් මැසීමෙන් ලත් කුලියෙනි. ජීවිතය හමුවෙහි වු අභියෝග ජයගැනීම උදෙසා යාන්තම් හය හතර තේරෙන වයසේ සිට ඔට්ටු වු මේ දිරිය කෙලිපොඩිත්තිය මට හමුවනවිට බොහෝ වැඩිමහළු වු කාන්තාවක බවට පත්ව සිටියාය. ඔබ මේ අසන්නේ ඇය මා සමඟ කියු ඇගේ ජීවිතයේ උත්සාහයේ කතාන්දරයයි.

''මගේ උපන් ගම කළුතර. තාත්තා රස්සාව විදිහට කළේ ගොවිතැන. සහෝදර සහෝදරියෝ දහදෙනෙක් හිටිය පවුලක මම අටවෙනියා. මම ඉස්කෝලේ ගියේ කළුතර නාගොඩ බාලිකා විද්‍යාලයට. මගේ ඉස්කෝලේ කාලේ හුඟක් ආර්ථික ප්‍රශ්නත් එක්ක ගෙවුණ යුගයක්. කොටින්ම මම ඉස්කෝලේ දාගෙන ගියේ අක්කලා පාවිච්චි කරපු පරණ ඇදුම්,සපත්තු. ගෙදරට තව දුරටත් බරක් වෙන්න බැරි නිසා සාමාන්‍ය පෙළින් පස්සේ ඉස්කෝලෙන් අස්වෙන්න මම තීරණය කළා. ඒ වෙනකොටත් මට සෑහෙන්න හොදට මහන්න පුළුවන්. ඊට අමතරව මම රූපලාවන්‍ය සම්බන්ධයෙන් හැදෑරීමක් කළා. ඔය අතර 1990 දී විතර මම විවාහ වුණා. මහත්තයා කළේ වඩු වැඩ. පුතා ලැබුණාට පස්සේ 92-93 විතර මම හිතුවා ගෙදරම පුංචියට ඇදුම් මැසීමේ ව්‍යාපාරයක් පටන් ගන්න. ඒ වෙද්දී අපි හිටියේ පුංචි ගේ කෑල්ලක. මට මහන මැෂිමක් තිබුණේ නෑ. කරේ දාගෙන හිටපු මාලේ උගස් තියලා මම සාමාන්‍ය සිංගර් මැෂිමක් මිළදී ගත්තා. ඊළඟට අහල පහල දන්න කියන ගෙවල් වලට ගිහින් ඇදුම් මහන්න ඇනවුම් ඉල්ල ගත්තා. එහෙමයි මම මේ ව්‍යාපාරය පටන් ගත්තේ. ඊළගට අපි එතෙක් උන්නු ගෙදර අත ඇරලා දැන් අපි මේ ඉන්න තැනට පුංචි කාමර දෙකක් හදාගෙන පදිංචියට ආවා. මේ ගෙදරට විදුලිය තිබුණේ නෑ. මම රෑ දෙක තුන වෙනකම් ඇදුම් මැහුවේ කුප්පි ලාම්පුවේ එළියෙන්. ගෙවෙන හැම දවසකම මම උත්සාහ කළේ ඒ දවස සාර්ථක කරගන්න. ජීවිතේ කලින් දවසට වඩා පියවරක් හරි ඉදිරියට තියන්න. මම ඉක්මණින්ම ගෙදරට විදුලිය ගත්තා. ඔය අතරේ තමයි මගේ තුන්වෙනි දුව ස්නායු ආබාධයකින් පෙලෙන්න ගත්තේ. දවසින් දවස ගොඩනගාගෙන ආපු අපේ ජීවිතේ දුවගේ අසනීපෙත් එක්ක කඩා වැටෙන්න ගත්තා. අපි රට වටේම ඉන්න වෛද්‍යවරු ළගට විතරක් නෙවෙයි දන්න දන්න පන්සල් පල්ලි දේවාල ගානේ ගියේ මගේ දුවව හොඳ කරගන්න. නොහිතපු විදිහට ජීවිතේ මතට කඩා වැටුණු මේ විපත්තියත් එක්ක කඩා නොවැටී මානසිකව තව තවත් ශක්තිමත් වෙන්න මම හිතාගත්තා. ව්‍යාපාරය කරගෙන යන්න මට මුදලක් ගන්න ඕන වුණා. ඒ ගමන තමයි මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනේ. ඒ 2005 අවුරුද්දේ. බැංකුවකට ගිහින් ණය මුදලක් ඉල්ල ගන්න ඕන සුදුසුකම් කිසිම දෙයක් නැති අපි වගේ අයට ග්‍රාමීන් සමාගම ඒ වෙලාවේ පිහිට වුණේ ඉටු දෙවියෙක් වගේ. මම මුලින්ම ගත්තේ රු.15000 ණය මුදලක්. එතැන ඉදන් 25,000 - 100,000 වෙනතුරු ණය අරන් ව්‍යාපාරය දියුණු කර ගත්තා. ඔය අතරෙම මම විදේශ රැකියාවකටත් ගියා අවුරුදු දෙකකට. ඒ ගිහින් ඇවිල්ලා ආපහු මැහුම් ව්‍යාපාරයම ඉදිරියට පවත්වාගෙන ගියා, මගේ දරුවන්ට ලොකු ආශාවක් තිබුණා....

10 පිටුවට



සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායා - ලක්ෂමන් කුමාරතුංග

# ප්‍රයිම්ග්‍රාමීන් ශාඛාවක වගතුග




## ඔවුන් අප කෙරෙහි තබා සිටින අචල විශ්වාසය අදටත් නොබිඳී නොනැසී පවතින්නක්...

### ප්‍රයිම් ග්‍රාමීන් - නාවලපිටිය ශාඛාව

අවිස්සාවේල්ල පසුකොට ගිණිගත්හේනට පිවිසෙන අපට හාත්පස විහිදුණු කඳුකරයේ සිරියාව දෑස් පුරා විඳගන්නට ලැබෙන්නේ සොබාදහම පිළිබඳ විචිත්‍රවත් වූ සංකල්පනාවන් රැසක් සිතතුළ ජනිත වෙද්දීය. නිල්වන් කඳුයාය මතට වැටෙන කහපාට අව්රැල්ල අතරින් සිහින් වැසි දියත්තක් පොළොව තෙමද්දී අප ගිණිගත්හේනෙන් නාවලපිටියට වැටෙන මාර්ගය වෙත අවතීර්ණ වීමු.

සිංහල ද්‍රවිඩ මුස්ලිම් ආදී ජනකොට්ඨාශ සමූහයක සම්මිශ්‍රනයක් වූ නාවලපිටිය බොහෝ සෙයින් සෞම්‍ය වූ දේශගුණික රටාවකට උරුමකම් කියනා ප්‍රදේශයක් ලෙස හැඳින්වීමේ වරදක් නැත.කඳුහෙල් අෑ භූවිෂමතා ලක්ෂණයන්ගෙන් ගහන ප්‍රදේශයක් තුළදී අත්විඳීමට සිදුවන දුෂ්කරතා සේම නිතර වෙනස් වන සුළු කාලගුණික රටාවක හිතුවක්කාරකම් සාමාන්‍යයක් ලෙස සලකන්නට හුරුවූ සොඳුරු තරුණ බලමුළුවක මෙහෙයුම් ක්‍රියාවලියකින් පණ ගැන්වුණු ප්‍රයිම් ග්‍රාමීන් නාවලපිටිය ශාඛාව මෙවර "ශාඛාවක වගතුග" සඳහා අපට නිමිත්ත සපයයි. නාවලපිටිය ශාඛාවේ වග විත්ති විමසන අපගේ පිළිසඳර කතාබහට එහි ශාඛා කළමනාකරු එස්.ටී.රවී මහතා සිය කටහඬ අවදිකළේ මේ අයුරිනි.

"ප්‍රයිම් ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 43 වන තැන හිමි නාවලපිටිය ශාඛාව ප්‍රයිම් ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවට එක්වෙන්නේ 2005 .11 20 වෙනිදා ඉඳන්. එදා ඉඳන් අද වෙනතුරු ගෙවී ගිය කාල පරිච්ඡේදය තුළ මේ ප්‍රදේශයේ පවුල් දසදහස් ගණනකට ට සේවාව ලබාදීමට අපට හැකිවුණා. නාවලපිටිය කියන්නේ තරමක් සෞම්‍ය දේශගුණික රටාවකට උරුමකම් කියන ප්‍රදේශයක් වගේම ඉක්මණින් කාලගුණික විපර්යාසයන්ට ලක්වෙන ප්‍රදේශයක්. , මීදුම, කඳුහෙල් පල්ලම් සහ තේවතු සහිත දුෂ්කර මාර්ග...ඒ වගේම සුන්දර දියඇලි මවන විචිත්‍රත්වය ශ්‍රී පාද කඳු පංතියේ ශාන්ත දර්ශනය මේ සියල්ලක්ම අපේ නිළධාරින්ගේ දෛනික රාජකාරියේ ම කොටස් බවට පත්වුණු දේවල් වෙලා. ඒත් ඒ කිසිම දෙයක් රාජකාරියට බාධාවක් කර නොගෙන තම වෘත්තීය ඉලක්ක හඹායන ශක්තිමත් තරුණ කණ්ඩායමක් සමඟ එක්ව වැඩ කිරීමට ලැබී තිබෙන බව පළමුවෙන්ම සඳහන් කරන්න ඕන.

"ප්‍රයිම් ග්‍රාමීන් ශාඛාවක් නාවලපිටියේ ස්ථාපිත වෙන්නේ 2005 දී ඒ අංක 168/18 කොත්මලේ පාර, නාවලපිටිය දරණ තැන. ඊළඟට 185 කොත්මලේ පාර, නාවලපිටිය ලිපිනයට අපි ශාඛාව ගෙනගියා. 2009 ජනවාරි 02වෙනිදා අපි අංක 32/2 අඹගමුව පාර නාවලපිටිය කියන දැන් අපේ ශාඛාව පවත්වාගෙන යන ලිපිනයේ නව ගොඩනැගිල්ලකට ගෙවැදුණේ අපේ ගනුදෙනු කරුවන්ට මෙන්ම මෙහෙයුම් කටයුතු වලටත් පහසුවක් වෙන්න . නාවලපිටිය විවිධාකාරයේ ව්‍යාපාර දකින්න පුළුවන් ප්‍රදේශයක් කියලා හැඳින්වීමේ වරදක් නෑ. විශේෂයෙන් එළවළු වගාව, තේ වගාව, ආශ්‍රිත ව්‍යාපාර මේ ප්‍රදේශයේ බහුලයි. ප්‍රදේශ වශයෙන් ගත්තොත් හැටන් පැත්ත තේ වගාව බහුල ලෙස දකින්න පුළුවන්. ඒ හැරුණාම තිස්පනේ එළවළු වගාවේ යෙදෙන පිරිස් වැඩියි.කිතුල්ගල පැණි සහ හකුරු නිශ්පාදනයටත් ගම්පල ලීබඩු නිශ්පාදනය අත්කම් ආදියටත් වැලිගඟ බෙර වර්ග නිශ්පාදනයටත් විශේෂත්වයක් දක්වනවා. ඒ හැරුණාම අනෙක් ඕනෑම ප්‍රදේශයක දකින්න පුළුවන් සාමාන්‍ය ව්‍යාපාර මේ ප්‍රදේශයෙත් තියෙනවා. අපේ සාමාජිකාවන් මේ විවිධ තරාතිරමේ ව්‍යාපාරවල නිරත වෙනවා. ඔවුන්ට එම ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමට අප සැදී පැහැදී සිටිනවා . අද වන විට අපේ මධ්‍යස්ථාන 113 සාමාජිකාවන් 4208 කට ණය පහසුකම් ලබා දී තියෙනවා. ඔවුන්ගේ ව්‍යාපාර සදහා නිකුත් කර ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 468 ක්.

නාවලපිටිය ශාඛාව මගින් මෙහෙයවනු ලබන මධ්‍යස්ථාන විශාල ප්‍රදේශයක් පුරා විහිදී පැතිරී තියෙනවා. නාවලපිටියෙ සිට හැටන් පාරේ බගවන්තලාව,මස්කෙලිය දක්වාත්, ගම්පල පාරේ වට්ටප්පල දක්වාත් කොත්මලේ පාරේ තිස්පනේ දක්වාත් අවිස්සාවේල්ල පාරේ ගෝනගමුව දක්වාත් අපේ මධ්‍යස්ථාන 113 ක් ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා අප සමාගමේ...

05 පිටුවට

**සටහන -**
**මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි**
**ඡායාරූප -**
**ලක්ෂමන් කුමාරතුංග**

| මධ්‍යස්ථාන සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | නිකුත් කළ ණය ප්‍රමාණය රු. |
|---|---|---|---|
| 113 | 4208 | 18 | රු. මි. 468 |


ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ නාවලපිටිය ශාඛාවේ කාර්ය මණ්ඩලය

**ප්‍රයිම් ග්‍රාමීන් නාවලපිටිය ශාඛාවේ නිළධාරී මඬුල්ල**

**ප්‍රාදේශිය කළමනාකරු**
සුදත් අසංක

**ශාඛා කළමනාකරු**
එස්.ටී.රවී

**සහකාර කළමනාකරු**
ප්‍රියන්ත කුමාර සුබසිංහ

**මූල්‍ය අංශ ප්‍රධානි**
නිශාන්ත ප්‍රදීප් කුමාර

**ක්ෂේත්‍ර කළමනාකරු**
නලීන් අසංක
සමීර වසන්ත

**ක්ෂේත්‍ර විධායක**
ඉන්දික රොහාන්
ගයාන් රවීන්ද්‍ර
ඉන්දික දොරකුඹුර
ගීත් නදීශාන්
චාමර ප්‍රසාද්
සුරංග බණ්ඩාර
සුදත් මනෝරංජන
සඳරුවන් ජයරත්න
සමීර ප්‍රියදර්ශන

**ඉතුරුම් විධායක**
චන්දන කීර්ති

**ගිණුම් සහායක**
අනුෂ්කා දමයන්ති
රුමේෂ් දිල්රුක්ෂ
රවීන්ද්‍ර බණ්ඩාර

04 පිටුවෙන්

සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකාවන්හට සුළු ව්‍යාපාර සඳහා ණය මුදල් ලබාදෙනවා.

ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් මගින් හදුන්වාදී ඇති ඉතුරුම් ක්‍රම වූ "යාළු"ළමා ඉතුරුම් ගිණුම මියුලැසි කාන්තා ඉතුරුම් ගිණුම සහ ප්‍රයිම් ඉතුරුම් ගිණුම යන ගිණුම් ක්‍රමත් අභිලාෂ , ස්වශක්ති, ඊසි ලෝන් යන ණය ක්‍රම සියල්ලත් අපේ ශාඛාවෙහි ක්‍රියාත්මකයි. සාමාජිකාවන් ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ක්ෂණිකව ලබාදෙන "සහන ණය " ණය ක්‍රමය යටතේ අපේ සාමාජිකාවන්ගේ දූ දරුවන්ගෙ අධ්‍යාපනික අවශ්‍යතා එදිනෙදා වියදම් ආදියට යම් පිළිසරණක් වීමට අපි කටයුතු කරනවා. මේ යටතේ පසුගිය කාලය තුළ රුෑමි: 56 මුදලක් සහන ණය වශයෙන් අපි ලබාදුන්නා. සාමාජිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුලේ උදවිය වෙනුවෙන් සලසා ඇති සාමාජිකාව සහ ණය ආරක්ෂණ අරමුදල යටතේ මරණාධාර සහ වන්දි මුදල් වශයෙන් රුපියල් 400000 මුදලක් ලබාදීමට පසුගිය කාලය තුළ අපි කටයුතු කළා.

පසුගිය වසර පහළොව පුරා වඩාත් ජනතාවට සමීප වූ සේවාවක් ලබාදීමට අප කළ කැපකිරීම් නිසාම වෙනත් මූල්‍ය ආයතන රාශියක් තිබුණත් ඒ කිසිවකටත් ළඟා වීමට බැරි ස්ථාවරත්වයක් සහ ජනප්‍රියත්වයක් අප දිනා සිටිනවා. අප සමඟ බැඳී සිටින අපගේ සාමාජිකාවන් අතරින් සමහරක් පසුගිය කාලය පුරාම අප සමඟ ගනු දෙනු කළ අය ඔවුන් අප කෙරෙහි තබාගෙන සිටින අචල විශ්වාසය අදටත් නොබිඳී නොනැසී පවතින්නක්. අප ගනුදෙනුකරුවන් වෙත ණය මුදලක් ලබාදීමෙන් පමණක් සෑහීමකට පත්වන සමාගමක් නොවෙයි. ඔවුන්ගේ ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය උපදේශනය ලබාදීම සහ පුහුණු වැඩසටහන් සංවිධානය කොට ඒවාට ඔවුන්ව සම්බන්ධ කර ගැනීමට අප නිතරම උත්සුක වෙනවා.මූල්‍ය ආයතනයක් විදිහට ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ දැක්ම යථාර්ථයක් බවට පත්කිරීමට අවශ්‍ය සහාය නිරතුරුව ලබා දීමට අපි කැපවෙනවා.

**ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්**
**අංක 32/2,**
**පළමු මහල ,**
**අඹගමුව පාර,**
**නාවලපිටිය.**
**දුරඃ 0542224131**
**ඊ මේල්**
nawalapitiya@primegrameen.lk

## "අපේ ජීවිත නගා සිටුවන වැඩපිළිවෙලට උරදුන්නේ ග්‍රාමීන් සමාගමයි."



පල්ලේගම අටබාගේ පදිංචි ඉරේෂා කුමාරි සහ ඒ අවට සිටින තවත් පවුල් කිහිපයකම ජීවනෝපාය සරි කරන ස්වයං රැකියාව වී ඇත්තේ ප්ලාස්ටෝපැරිස් භාවිතයෙන් නිෂ්පාදනය කෙරෙන ප්‍රතිමා, මල්වාස් ඇතුළු විවිධ අනුරූ නිමැවීමය.සාදනු ලබන ප්‍රතිමා වර්ණ ගන්වා හැඩ ගැන්වීම සිදුකරනුයේද ඔවුන් විසින්මය.එක් අතකින් බලන කළ කුඩා කලාගාර බඳු වූ ඉරේෂලාගේ කුඩා මඩුව නෙතට ප්‍රිය දසුනකි.

".....අවුරුදු තුනක් වෙනවා අපි ප්ලාස්ටෝපැරිස් වලින් නිර්මාණ කරන්න පටන් අරන්. බුද්ධ රූප,දේව රූප,මල්වාස්,පුංචි පුංචි අනුරූ අපි හදනවා. ප්ලාස්ටෝපැරිස් කොළඹින් ගෙනැල්ලා බඩු හදලා පැක් කරලා විකුණන්න කොළඹටම යවනවා. අපේ බඩු ගන්න සාප්පු කිහිපයක් එහේ තියෙනවා.ඊට අමතරව පෙරහැර කාලවලට විවිධ උත්සව තියෙන තැන් වලට අපි මේවා අරන් ගිහින් තියාගෙන විකුණනවා. තව තොග වෙළෙන්දෝ අපි ළඟට ඇවිල්ලත් ගෙනියනවා. කොහොම වුනත් මේ ව්‍යාපාරය පාඩු ලබන ව්‍යාපාරයක් නෙවෙයි. හදන තරමක් විකුණන්න පුළුවන්. වෙලා තියෙන්නෙ බැංකුවලින් අපි වගේ පුංචි ව්‍යාපාරිකයන්ට ණයක් දෙන්නෙ නැතිකම. ඒ අඩුව පිරෙව්වේ ග්‍රාමීන් සමාගම කියලා අපි කියන්නේ ලොකු සතුටකින්.මොකද ලොකු ලොකු ව්‍යාපාරවලට ණය දෙන්න ඕනතරම් අය ඉන්නවා.ඒත් මේ රටේ පුංචි දුප්පත් මිනිස්සුන්ට අතක් දෙන්නෙ කවුද. අපට සහනාධාර ඕන නෑ.අපි ඉල්ලන්නේ අපේ ජීවිත නගා සිටුවන වැඩ පිළිවෙලක් ඒ වැඩපිළිවෙලට උරදුන්නේ ග්‍රාමීන් සමාගමයි."

**- ඉරේෂා කුමාරි, පල්ලේගම අටබාගේ -**

## ණය උගුල්වලට අහුනොවී ව්‍යාපාරය වර්ධනය කර ගන්න ග්‍රාමීන් සමාගම අපිට මග පෙන්වනවා.






ගම්පළ ප්‍රධාන පාරෙන් හැරී කුඩා කොන්ක්‍රීට් පාරක් දිගේ පල්ලම බසින විට පල්ලමේ මදක් හරියට වන්නට දීපානි වීරසිංහලාගේ නිවස පිහිටා ඇත. ඒ පල්ලම බැසීම තරමක් අසීරුය. බැසීමට අසීරු පල්ලම නැගීම ඊටත් අසීරුය. හරියට දීපානිලාගේ ජීවිතය වගේය. ජීවන කන්ද නැග ගැනීමට ග්‍රාමීන් පිළිසරණ සෙවූ දීපානි අද එහි සාමාජිකාවකි.

"....මම ස්වයං රැකියාව විදියට කරන්නේ රස කැවිලි නිශ්පාදනය. මාස්මෙලෝස්, අළුවා, කැවුම්, දොදොල්, තල........ මේ හැම රසකැවිලි වර්ගයක්ම අපි හදනවා. හදන කෑම වර්ග ගම්පල ටවුමේ කඩවලටත් විදාතා එකටත් දානවා. දැන් අවුරුදු 1 1/2 ඉදන් අපේ ජීවනෝපාය වෙලා තියෙන්නේ මේ කර්මාන්තේ. ස්වයං රැකියාවන් සඳහා ග්‍රාමීන් සමාගම ණය දෙනවා කියන ආරංචියට මීට අවුරුදු එකහමාරකට කලින් මීකේ සාමාජිකාවක් වුණා. රු. 25,000/- ණය මුදලෙන් පටන් අරන් 50,000/-, 100,000/-, 200,000/- දක්වා ණය මුදල් අරන් තියෙනවා, වර්ධනය වන ණය මුදලට සාපේක්ෂව අපේ ව්‍යාපාරයත් වර්ධනය වෙන්න ඕන නැත්තම් කොහොමද මේ ණය ආපහු ගෙවන්නේ, ග්‍රාමීන් එකෙන් ණය මුදලක් දෙන්නේ ව්‍යාපාරය පිළිබදව පුළුල් අධීක්ෂණයකින් පස්සේ, නැත්නම් හිතුමනාපේ ණය අරන් අමාරුවේ වැටෙන්නේ ණය ගන්නා අපිමයි කියලා ඒ සර්ලා අපිට කියලා දෙනවා. ඒ වගේ ණය උගුල්වලට අහුනොවී අපේ ව්‍යාපාරයත් අපේ ජීවිතයත් වර්ධනය කර ගන්න ග්‍රාමීන් සමාගම නිතරම අපිට මග පෙන්වනවා.

**දීපානි වීරසිංහ - සේනානි සෙවණ, ස්ටොෆිල්ඩ්, ගම්පොළ.**

## කවරයේ කතාව



අප එහි යනවිටද සාරා සිටියේ සිහින්ව කපා ගත් කඩදාසි තීරු කුඩා යන්ත්‍රයක් අනුසාරයෙන් රෝල් කරමින්ය.කාඩ්බෝඩයක් මත අඳින ලද මොනරෙකුගේ සිත්තමක් මත රවුම් සහ ඕවලාකාර හැඩයට සකසා ගන්නා ලද නිල් කහ කොළ පැහැයෙන් යුත් කඩදාසි රවුම් ඉතා සීරුවට ගම් යොදමින් අලවන ආකාරය බලා සිටීමට ආශාය.මොහොතකින් මොනරාගේ පිල් කළඹ අලවා අවසන් වෙද්දී ඊළගට ඇගේ ඇඟිලි තුඩු දිවයන්නේ මොනරාගේ හිස කඳ හා දෙපා කොටස් එබඳුම රවුම් හැඩ කඩදාසි වලින් හැඩ ගැන්වීමටය.තවත් මොහොතකින් අත්තක් මත වසා සිටිනා මොනරකුගේ අපූරු කොලාජ් සිතුවමක් අප හට දැකිය හැකි විය. සාරා සිය ව්‍යපාරය කොටගෙන ඇත්තේ කුඩා විසිතුරු නිර්මාණ නිශ්පාදනයය.

".....මට මේ කටයුත්ත සඳහා එකවර මුදල් සොයාගැනීම අපහසුයි.ග්‍රාමීන් සමාගමේ ණය ක්‍රමය සමග මම සම්බන්ධ වෙන්නේ ඒකට විසදුමක් විදිහටයි.අපි හදන ඒවා ගැටඹේ කුඩා කර්මාන්ත අමාත්‍යංශය විසින් මිලදී ගන්නවා.ඊට අමතරව අපි අපේ විසිතුරු නිර්මාණ සාප්පු කිහිපයකට දානවා.විදේශ සංචාරකයින්ගෙන් මේවා සඳහා හොඳ ඉල්ලුමක් තියෙනවා.හදන තරමක් දෙන්න පුළුවන්.ග්‍රාමීන් ණය ක්‍රමය නිසා අපිට අපේ ව්‍යපාරය ඉතා සැහැල්ලුවෙන් කරගෙන යාමට පුළුවන්.ඇය පවසන්නේ සිනාමුසුවය.

**පාතිමා සාරා කම්බිඅඩිය, ගම්පල**

## ග්‍රාමීන් ණය ක්‍රමයේ අනවශ්‍ය රස්තියාදු නැහැ...



මමත් කරන්නේ ප්ලාස්ටෝපැරිස් නිෂ්පාදන නිර්මාණය කරන එක.මෝල්ඩින් තිබුණු පලියට මේක එහෙම පහසුවෙන් කරන්න පුළුවන් කර්මාන්තයක් නෙවෙයි. ඒකට අතේ හුරුව වගේම සායම් කිරීම ගැන අවබෝධයත් සමඟ කුසලතාවයක් තියෙන්න ඕනෑ.කාලයක් අපි මේ ව්‍යාපාරය සදහා යොදවන්න මුදල් නැතිව අසරණ වෙලා හිටියා.මොකද ප්ලාස්ටෝපැරිස් ගන්න, මෝල්ඩින් හදන්න, සායම් ගන්න සල්ලි ඕනෑ.ග්‍රාමීන් මධ්‍යස්ථානයක් පල්ලේගමට ආවට පස්සේ තමයි අපිට කරදරයක් නැතිව මේ ස්වයං රැකියාව කරගෙන යන්න පුළුවන් වුණේ. මම20,000 ණය මුදලේ සිට 80,000 ණය මුදල දක්වා දැන් පියවරෙන් පියවර ඇවිත් තියෙනවා.ග්‍රාමීන් සමාගමේ මම දකින ලොකුම විශේෂත්වය තමයි ඒකේ සර්ලගෙ තියෙන නිහමානිකම, වෙන තැනකින් ණයක් ගන්න දවස් ගණන් ඒ ආයතනවලට ගිහින් රස්තියාදු වෙන්න ඕන,පෝලිම් වල ඉඳලා ෆෝම් කොළ පුරවලා රටේ නැති නීති. ග්‍රාමීන් ණය ක්‍රමයේ මේ මොකුත් නෑ.මධ්‍යස්ථානය තියෙන්නේ අපේ ගමේම කිට්ටුව පාත.ඕන දෙයක් ඒ සර්ලා එක්ක කතා කරලා නිරාකරණය කරගන්න පුළුවන්.

**-පී. අශෝධනි,පල්ලේගම අටබාගේ**

**සතුටින් සිටිමට පරක්කු විය යුතු නැත, මේ දැන් සිටම සතුටින් සිටිය යුතු වේ.**







# ඔබ (නො)දන්න මම

## සුදේශ් පෙරේරා
### ජ්‍යේෂ්ඨ කළමනාකරු ප්‍රධාන කාර්යාලය



# ග්‍රාමින් එකෙන් රු 5000 ණය මුදලක් අරන් මම ටීෂර්ට් විකුණන බිස්නස් එකක් පටන් ගත්තා.

සටහන
මංජුල හෙට්ටිආරච්චි

**සම්පූර්න නම :-** වීරක්කොඩිගේ සුදේශ් පෙරේරා

**උපන් දිනය (කැමති නම්) :-** 1975.11.06

**පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :-** මම පාසැල් දෙකකට ගියා. එකක් කොල්ලුපිටියේ "මාෂල් ප්‍රේ" විදුහලට. ඒකට 2 පංතියට වෙනකම් ගියා. ඊට පස්සෙ කොල්ලුපිටියේ ශාන්ත මයිකල් විද්‍යාලයට ගියා.හැබැයි මගේ ප්‍රියතම පාසැල ඒ දෙකෙන් එකක්වත් නෙවෙයි.මම යන්න පෙරුම් පුරපු පාසැල මහානාම විද්‍යාලය. ඒකට හේතුවක් තිබුණා. මගේ ජීවිතයේ තිබුණු ලොකුම බලාපොරොත්තුව තමයි ක්‍රීඩා අංශයෙන් වගේම අධ්‍යාපනික අංශයෙනුත් ඉහලටම යන එක.ඒත් මම ගිය පාසැලේ ක්‍රීඩා අංශය සම්බන්ධයෙන් ලොකු උනන්දුවක් තිබුණෙ නෑ.ඒ කාලේ මට හීනයක් තිබුණා අපේ ගෙවල් වලට කිට්ටුවෙන්ම තිබුණු මහනාමයට යන්න

**විෂය :-** සංගීතය. ඒත් ඒ විෂය හදාරන්න මම ගිය පාසැලේ පහසුකම් තිබුණෙ නෑ.

**ක්‍රීඩාව :-** පාපන්දු. මුලින්ම මම පාසැලේ බොක්සිං ක්‍රීඩාකළා. ඒත් අවුරුදු දෙක තුනකින් මම බොක්සිං ක්‍රීඩාවෙන් ඈත්වෙලා පාපන්දු වලට යොමු වුණා. පාසැල් ක්‍රීඩකයෙක් විදිහට වගේම ක්‍රිඩා සමාජයක සාමාජිකයෙක් විදිහටත් මම දිගටම සෙල්ලම් කරනවා. මේ වෙද්දි කොල්ලුපිටියෙ යුනයිටඩ් ක්‍රීඩා සමාජයේ පාපන්දු ක්‍රිඩකයෙක් විදිහට මම කටයුතු කරනවා.

**පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :-** මගේ හිතේ ලොකුවටම තිබුණු ආශාව තමයි කවදා හරි ක්‍රීඩා උපදේශක වරයෙක් වීම.ඒකට බලපාපු හේතුවක් තිබුණා. මගේ තාත්තා කොළඹ නගර සභාවේ පාපන්දු ක්‍රීඩාව සම්බන්ධයෙන් උපදේශකවරයෙක්.

**ජීවිතයට අහිමි වුණු වටිනාම පුද්ගලයා හෝ වස්තුව :-** මගේ තාත්තා. මට වයස අවුරුදු 24 දී එයාව මට නැතිවුණා. මට හිටිය හොඳම ක්‍රීඩා ගුරුවරයාව ඒත් එක්ක මට අහිමි වුණා. අපේ තාත්තා ඉතාම අවංක දක්ෂ ක්‍රීඩා උපදේශකවරයෙක්. රැකියාවේදී ඔහුට මා පවා සාමාන්‍ය කෙනෙක් වුණා. මම පරක්කු වෙලා පුහුණු වීම් වලට ගිය දවසක ඔහු මාව පුහුණු වීම් වලට සම්බන්ධ කරගත්තෙ නෑ. ඒ වෙනුවට මට සිද්ධ වුණේ ක්‍රීඩා පිට්ටනිය වටේ රවුම් කිහිපයක් දිවීමටයි.එතැනදි මාව ඔහුට තවත් එක් ශිෂ්‍යයෙක් විතරයි. මේ අවංක බව නිසාම තාත්තාව නොරිස්සු ඉහළ නිළධාරීන් ඔහු ලවා ඔවුන්ගේ පරමාර්ථ ඉෂ්ට කරගන්න නොහැකි වූ තැන වතාවන් කිහිපයකදීම තාත්තාගෙ වැඩ තහනම් කළා.ඒ තත්වය අපේ පවුලේ ආර්ථිකයට අපේ අධ්‍යාපන කටයුතු කඩා කප්පල් වෙන්න සෘජුවම බලපෑවා කියන කාරණයට අමතරව ඒ නිසා ඔහු විඳෙව්ව තරම මට අමතක වෙන්නෙ නෑ

**ජීවිතේ අමතක නොවන සිද්ධිය :-** මගේ තාත්තාගෙ (බර්ටිපාල පෙරේරා) මරණය. මම තාත්තත් එක්ක ජීවිතේ ලොකු ගමනක් යන්න පෙරුම් පිරුවා. රස්සාවෙ ප්‍රශ්න නිසා තාත්තා හිටියේ ලොකු කළකිරීමකින්. අසනීප වුණේ ඒ මානසික කළකිරීමත් එක්ක. නැත්නම් තාත්තා ඉතා ශක්තිමත් දැවැන්ත පුද්ගලයෙක්. මමයි තාත්තයි එකට තිබ්බාම ලිලිපුට්ටයි ගලිවරුයි වගේ. ඒ වෙද්දි මම වැඩ කළේ රෙස්ටුරන්ට් එකේ. තාත්තට අසනීපයි කියලා මට කෝල් එකක් ආවා. ඒ දවස් වල ඉස්පිරිතාලවල ස්ට්‍රයික් එකක් තිබුණා. ඒ ගමන මම සෙන්ට්‍රල් එකේ ඩොක්ටර් කෙනෙක්වත් චැනල් කරලා ගෙදර එද්දි තාත්තා නැතිවෙලා.

**මුල්ම ජොබ් එක හොයාගන්න වින්ද දුක :-** තාත්තගෙ ජොබ් එකේ ප්‍රශ්නෙත් එක්ක ගෙදර ආර්ථිකය කඩා වැටෙද්දි මම හිතුවා ඉගෙනීම නවත්තලා රස්සාවක් කරන්න. මගෙ පළමු රස්සාව වුණෙ ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් කොම්පැනියේ අනියම් කම්කරු රස්සාවක්. ඒකේ යාර්ඩ් එකට එන කන්ටේනර් වල බඩු බාන්නයි තිබුනේ. දවසකට රු 75 පඩිය. මම රෑ වෙනකල් වැඩ කරලා දවසකට රු 100, 150 වගේ ගාණක් හොයා ගත්තා. එතැන මම මාස හයක් වැඩ කළා. ඊළඟට මගේ ඥාති අක්කා කෙනෙක්ගෙ හෝටලේක ස්ටුවර්ට් කෙනෙක් විදිහටත් ජැයික් හිල්ටන් එකේ එපාර්ට්මන්ට් වල හවුස් කීපර් කෙනෙක් විදිහටත් රස්සාව කළා. ඒ වෙද්දි මට හොඳ පඩියක් ලැබෙනවා. මම හොඳට කෑවා ඇන්දා සතුටු වුණා.ඔහොම අවුරුදු දෙකක් විතර ඉන්දැද්දි පොඩි ප්‍රශ්නයක් වෙලා මට රස්සාවෙන් අයින් වෙන්න වුණා.සත පහ අතේ නැතිවෙන තත්වයට පත්වෙද්දි ග්‍රාමින් එකේ මුල්ම සෙන්ටර් එක ෆෝම් කරන්න ඒකේ නිළධාරි මහත්වරු වගයක් අපේ ගෙවල් තිබුණු කොල්ලුපිටියේ පල්ලිය පටුමඟට ආවා. එතකොට පිරිමින්ටත් ණය දෙනවා.සල්ලි නැතිව හිටිය හින්දා මමයි තව බොතේජු කියලා යාළුවෙකුයි කණ්ඩාමක් හදාගෙන බිස්නස් එකක් පටන් ගන්න ණයක් ඉල්ලුවා. රු 5000 ණය මුදල අරන් අපි ටීෂර්ට් විකුණන බිස්නස් එකක් පටන් ගත්තා. වැඩේ හොඳට කරගෙන යද්දි ග්‍රාමින් එක විවෘත කරන උත්සවයට අපේ මධ්‍යස්ථානයත් සරසන්න කියලාඅපිට බාරදුන්නා.එතකොට අපේ මධ්‍යස්ථානය වුණේ බෝඩිමක්. අපි ඒක හොඳට සැරසුවා.අපේ වැඩ ගැන ආයතනය පැහැදිලා අපිව ග්‍රාමින් එකේ රස්සාවට ගත්තා.මට මුලින්ම ලැබුණෙ ෂොප් හවුස් එකේ සහායක තනතුරක්.

**ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය :-** සතුටට පත්වුණු දිනය තමයි මගේ බිරිඳව මුලින්ම දැක්ක දවස.ඒ වෙද්දි පෙම්වතියො හය හත්දෙනෙක් එක්ක යාළුවෙලා තරහාවෙලා හිටිය මට ගංගාව මුලින්ම දැක්ක දවසේ හිතුණා මම මෙච්චර කලක් හොයමින් හිටියේ ඇයවයි කියලා. දුකට පත්වුණු දිනය තමයි මම අපේ අම්මගේ උපන් දිනේ දවසක 2012. අප්‍රේල් 14 ඇයව දඹදිව යවන්න ලෑස්තිවෙලා හිටියා.ඒත් සල්ලි ප්‍රශ්නයක් වෙලා එදා මට ඒදේ කර ගන්න බැරි වුණා.

**අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව :-** මගේ පාසැල් කාලය. විවිධ හේතු නිසා මට මගේ අධ්‍යාපන කටයුතු හරියට කරගන්න බැරි වුණා....නැවත ඒ අතීතයට යන්න ලැබුණොත් මට ඒ අඩුපාඩුව හරි ගස්සාගන්නපුළුවන් වේවි.

**හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :-** මම අවංක වැඩියි කියලා.

සැලසුම් බාගෙට හදන්න එපා, උපරිමයෙන් සැලසුම් කරන්න.

මම හිතනවා.ඒක දුර්වලතාවක් නොවුණත් මේ සමාජ ක්‍රමය තුළ අවංක කම බොහෝ ප්‍රශ්න ඇතිකරනවා. මේ නිසාම මම මගේ ජීවිතේ හුඟක් දේවල් නැතිකරගෙන තියෙනවා.

**ඔබේ ජීවිතයට බලපෑ පූර්වාදර්ශී පුද්ගලයකු සිටී නම් ඔහු හෝ ඇය ඃ-** මගේ අම්මා. ඇය තරම් ශක්තිමත් කාන්තාවක් තවත් මම දැකලා නැහැ. නගර සභාවෙන් තාත්තගෙ පැන්ෂන් එක පවා අහිමි කරලා තියෙද්දි අම්මා මාස හයක් තනියම දුක්විඳලා දන්න නොදන්න ලොකුලොක්කො හම්බවෙලා මේ ප්‍රශ්නෙ කියලා තාත්තට අහිමිවුණු පැන්ෂන් එක හදලා දුන්නා. ඇය එඩිතරයි. ඒ වගේම අධිෂ්ඨානශීලියි.

**පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම ඃ-** මට වයස 22 දි ඇය මට අහම්බෙන් මුණ ගැසුණේ. එතකොට ඒ ළමයාට වයස 17යි. හුඟක් පොහොසත්. මගේ ආර්ථික ප්‍රශ්න වලදි මට හුඟක් උදව් කළා. ඒත් හඳහන් නොගැලපීම නිසා අපේ ආදරය අතරමඟක නැවතුණා.

**ඔබ දකින ඔබේ චරිතයේ සුවිශේෂී ගුණාංගයඃ-** මම හරි නිදහස් විනෝදකාමී පුද්ගලයෙක්. ලැබෙන දෙයින් සතුටුවෙලා ජීවත්වෙන්න මම දන්නවා.

**ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද ඃ-** ඔව්, මනුස්ස ආත්මයක් ලබන්න කොයිතරම් පිං කරන්න ඕනද..ඉතින් මේ වගේ ජීවිතයක් ලැබීම ගැන මම ඇත්තෙන්ම තෘප්තිමත් .

**ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂය (terning Point)ඃ-** ග්‍රාමීන් එකේ රැකියාවක් ලැබීම. මම මුලින්ම පරිඝනකයක් ඉදිරියේ ඉඳගත්තේ, සමාජයේ පිළිගැනීමක් ලැබුවේ, මේ ගෙවල් දොරවල් හැමදේම මම ලැබුවේ ග්‍රාමීන් එක නිසා

**ඔබේ ප්‍රියතම ගායකයා ඃ-** එච් .ආර්.ජෝතිපාල


**ගීතය ඃ-** ජෝතිගේ රන්මසු රන් ගිරි පළිඟු තලාවක

**චිත්‍රපටිය ඃ-** ජූලියා රොබට්ගේ Un Faithful

**කෘතිය ඃ-** එකම එක පොතක් කියෙව්වා මතකයි “ඇඩූ කඳුළු මුහුදට එක් වුනාදෝ ”කියලා නවකතාවක්

**අනාගත ඉලක්කය ඃ-** කොන්ද කෙලින් තියාගෙන ඉන්න පුළුවන් සාර්ථක ජීවිතයක්.❑





## මම

ඉපදී කිරි කැටියෙක්ව මේ ලොව එළිය     බලා
දවසින් දවස ටික ටික උස් මහත්     වෙලා
ගෙවිලා වසර හය හත සත් වස     ලබලා
කරනට අකුරු ගියනෙමි විදු පියස     බලා

ගෙතුව කොන්ඩ කරල් දෙක දෙපසට     දමලා
ඇඳ සුදු ගවුම් පොඩිය ටයි පටියක්     බැඳලා
පොත් ටික තුරුළු කොටගෙන විදු පියස     බලා
අකුරු කෙරුව සැටි මතකෙට එයි     නැගලා

ශිෂ්‍යත්වය ලියා සාපෙළ     විභාගය
උසස් පෙළින් මගෙ ඉරණම     විසදුනෙය
සමුගෙන දුකින් වුව විදුසෙවණින්     මප්‍රිය
නිවසට කොටුවුණේ මගෙ දෛවය     ලෙසය

යෞවනියක ලෙස කාලය ගෙවෙන     විට
දුන්නා කරකාර මා නොසිතුව     ලෙසට
පෙම්බර සැමියෙක්ගෙ ගුණ දත් බිරිඳක්     ලෙසට
ආදර මව් කෙනකු විය මම දරු     තිදෙනෙකුට

හදා වඩා දරුවන් උස් මහත්     කොට
යුතුකම් ඉටුකළා හැකි පමණින්     මෙමට
දරුවන්ගේද දරුවන් සිව් දෙනකු     හට
මිත්තණියක වන්ට පෙර පින් ලැබුණි     මට

බිළිඳු ළමාවිය පසු කර     යෞවනය
බිරිඳක මවක පසුවට මිත්තනිය     විය
ගැහැණියකට උරුම මේ පදවි     සය
විඳ ජීවිතේ අද ගෙවනවා මහළු     විය

**ඩී. ඒ. චාලට් විජයසිරි**
**ඉසුරුපුර මධ්‍යස්ථානය**
**හොරණ ශාඛාව**

## අවිඳු අඳුර...

අවිඳු අඳුරින් දැවෙන සතවෙත
කුළුණු ගුණයෙන් පා සෙනේ
තුන් ලොවම බුදු දහම් සිසිලෙන්
සැනසූ සම්බුදු හිමියනේ

සිවු දිසාවෙන් වසා පැතිරුණු
ගැලූ සදහම් සාගරේ
දෙසූ බණපද අමා දහරකි
ඔබේ ගුණදම් ආකරේ.....

ඔබේ කරුණා නෙතින් ලෝදම
සනසවා බැතිබර දිනේ
ලොව්තුරා බුදු පදවි ලැබ යළි
වඩිනු මැන බුදු හිමියනේ....

**ඩී.එච්.ඩී.පී. ජයමාලි**
**රත්නපුර ශාඛාව**



# පහන් තරුව



## අපේ සෙනෙහසට...

පිපුණු මලක සුවඳ
ඉසින්නට....
ඔබේ සිත් අරණ වෙත
අවසරද සබඳ මට
ආදරෙයි කියන්නට....

නළ මුදු සුවඳ පිරි
අපේ සෙනෙහසට....
බැති සිතින් පුදන්නට
පේවෙන්න අවසරද....
ඔබේ හදට ලංවෙන්න
හිරු දුටු පියුම සේ
නුඹේ සිනහා දැක
අවසරද පිබිදෙන්න....
විකසිතයි මගේ සිත

සඳු පෑයු නැති අහසේ
පාළුවක් නොදැනෙන්න....
තරු පොකුරු ඉස්සරව නුඹ....
සදා මගේ තනිය මකන්නට...
එකතු වන්නට එන්න....
මා.... හා....

**නදීකා ගීතාංජලී**

## micro credit සංකල්පය පිළිබඳ සරල කියැවීමක්

# මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදයේ ආරම්භය හා විකාශනය. - 6 කොටස



ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

තොරතුරුවල හිඩැස "ගැටළුකාරී සදාචාරාත්මක සැකයක්" (Moral Hazard Problem)ලෙස හඳුන්වනු ලබයි.

ලබා ගත් ණය මුදලක් නැවත නොගෙවන තත්වයක් තුළ සිදුවනුයේ ණය ලාභියා විසින් ණය ලබාදුන් ආයතනයේ වියදමින් සිය සුබ සිද්ධිය සලසා ගන්නා තත්වයකට පත්වීමයි.ණය ලබාදෙන මූල්‍ය ආයතන මෙම තත්වයෙන් යම් තරමකට හෝ මුදවා ගැනීමට මැදිහත් වන ආයතනයක් ලෙස ණය තොරතුරු කාර්යාංශය (CRIB) දැක්විය හැකිය. එනම් ණය ලාභියා පිළිබඳව වූ අසම්පූර්ණ තොරතුරු යම් තරමකට හෙළි කිරීමක් එමඟින් සිදුවේ.එම නිසා ණය තොරතුරු කාර්යාංශයේ දත්ත මත පදනම් වීම තුළින් මූල්‍ය ආයතන පත්විය හැකි අසීරුතාවයෙන් යම් පමණකට මිදෙනු හැකිය.

ණය ලබාදනු ලබන ආයතනය සහ ණය ලබාගන්නා පුද්ගලයා අතර අත්සන් කෙරෙන ගිවිසුමක් වෙතත් මෙම ගිවිසුමෙන් පිටත කුමන හෝ හේතුවක් දක්වමින් ණය ගෙවීම පැහැර හැරීමට ණයලාභියා කටයුතු කරනු දැකිය හැකි තත්වයකි.ණය ගෙවීම පැහැර හරින පුද්ගලයන්ට එරෙහිව ඇතැම් මූල්‍ය ආයතන මඟින් යම් දඩ මුදලක් අය කිරීමට කටයුතු කරනු දැකිය හැකිය.එමඟින් ණය ලාභියාට ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් යම් බලපෑමක් කළ හැකිය.

මෙවන් කොයි ආකාරයේ බලපෑම් කළ හැකි වුවද ණය මුදල ලබාදුන්නාට පසු එම ණය මුදල යොදවන ආකාරය පිළිබඳව පසු විපරමක් කිරීමෙන් ණය ආපසු අය කිරීමේදී විය හැකි අවධානම් තත්වයන් අවම කර ගැනීමට හැකියාව ලැබේ.එහෙත් මෙය 100% කිරීම අපහසු වන්නේ ඒ සඳහා අධික වියදමක් (Monitaring problem) වැය කිරීමට සිදුවන හෙයිනි.

ලබාගත් ණය මුදල් නිසි පරිදි ආයෝජනය කොට ආර්ථික තත්වය යහපත් අන්දමින් පවත්වාගෙන යන ඇතැම් ණය ලාභීන් පවා ඇතැම් අවස්ථාවල ලබාගත් ණය මුදල් නිසි පරිදි ගෙවීමට උනන්දු නොවන අවස්ථා කොතෙකුත් දක්නට ලැබේ.එවන් අවස්ථාවලදී මූල්‍ය සමාගම් විසින් බලය පාවිච්චි කොට අදාල ණය මුදල පියවා ගැනීමට කටයුතු කරනු දැකිය හැකිය.එසේ බලය පාවිච්චිකොට ණය මුදල අය කර ගැනීමේ ගැටළුවට මුහුණ දීමට සිදුවීම in forcement problem ලෙස හැදින්වේ.

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවත්නා රටවල දැකිය හැකි නීතිමය තත්වයන් තුළ නීතිමය ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වීම යනු කාලය සහ මුදල් අධික ලෙස වැය කිරීමට සිදුවන තත්වයකි. විශේෂයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය (Micro Loan) වශයෙන් ලබාදෙන කුඩා ණය මුදල් නැවත අය කර ගැනීමට යාමේදී මයික්‍රෝ ක්‍රෙඩිට් ආයතන මෙම ගැටළුවට බහුල ලෙස මුහුණ දේ. මෙහිදි මයික්‍රෝ ක්‍රෙඩිට් ආයතනයන්ට බැංකු ගතකළ හැකි ඇපයක් තබාගත හැකිනම් මෙවන් ගැටළු කාරී අවස්ථාවන්හිදී නීතියේ පිළිසරණ පැතීමට එය පිටුබලයක් වනු ඇත.❑

# තනි පුද්ගල ණය ක්‍රමයේ ඇති අභියෝගතා

## - 2 කොටස -

තනි පුද්ගල ණය ක්‍රමයේ ඇති අභියෝගතා පිළිබඳ මූලික හැඳින්වීමක් පසුගිය මෙහෙවර කලාපය තුළින් අපි සාකච්ඡා කළෙමු. එහිදි ණය අවධානමක් ඇතිවීමට බලපාන මූලික සාධකයක් ලෙස අප හඳුනාගන්නේ ණය ලබා ගන්නා පුද්ගලයා විසින් ලබාදෙනු ලබන තොරතුරු දත්ත මත පදනම්ව ණය ලබාදීමෙන් මතුවිය හැකි අවධානම් තත්වයන් පිළිබඳවය. ඒ පිළිබඳව තවත් ගැඹුරින් විමසා බැලීමේදී අපට පැහැදිලි වනුයේ ණය ලබා ගන්නා පුද්ගලයා හොඳින්ම දන්නා දෙයක් වූ ණය ලබාදෙන ආයතනය තමන් පිළිබඳ තොරතුරු 100% නොදන්නා බව ඔහු මූල්‍ය ආයතනයේ නීති රීති වලින් රිංගා යාමට ඉඩ හසර සලසා දෙන බවයි. ණය ලාභියා පිළිබඳව අප දන්නා සහ නොදන්නා

## සංස්කාරක සටහන....

# දිනෙන් දින පුළුල් වන "ග්‍රාමීන් මෙහෙවර"

ඊ පුවත්පතක් ලෙස සිංහලෙන් පළ කිරීම ආරම්භ කළ "මෙහෙවර" අප කළමනාකරණ අධ්‍යක්ෂක, ප්‍රධාන විධායක නිලධාරි චමින්ද ප්‍රභාත් මහතාණන්ගේ අදහසක් අනුව පළ කිරීම ඇරඹුවේ හරියටම මීට වසර තුනකට පෙරාතුවය.ග්‍රාමීන් සමාගමෙන් සිදු කරනු ලබන, මෙහෙවර, 48ක් වූ අප ශාඛාවන්හි සහ එකොළහක් වූ සේවා මධ්‍යස්ථාන්හි කාර්ය මණ්ඩලය අතරට සන්නිවේදනය කිරීමත් සමාගම විසින් හදුන්වා දෙනු ලබන නවතම මූල්‍ය සේවා පිළිබදව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමත් කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය අබෝධය පුළුල් කිරීමත්,ශාඛාවන් මගින් හා ප්‍රධාන කාර්යාලය මගින් සිදු කරනු ලබන සමාජ සත්කාරක සේවා පිළිබඳව සමස්ත ග්‍රාමීන් සමූහය දැනුවත් කිරීමත් මෙහෙවර ඇරඹීමේ මුඛ්‍ය පරමාර්ථය විය.

දිනෙන් දින පුළුල් වන ග්‍රාමීන් සමාගම පිළිබඳ තොරතුරු හා දැනුම අප කාර්ය මණ්ඩලය වෙත ප්‍රදානය කිරීම අපගේ ප්‍රධානතම අරමුණක් විය.පළමුව සිංහලෙන් පමණක් ඇරඹුණු "මෙහෙවර ඊ පුවත්පත" ද්‍රවිඩ භාෂාවෙන් පළ කිරීමටද කටයුතු කරන ලෙස නිරන්තරව පුවත්පත පිළිබදව අවධානයෙන් පසුවන ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ ඊළග ඉල්ලීම විය.එතුමන්ගේ මග පෙන්වීම මත 2014 නොවැම්බර් මාසයේ සිට මෙහෙවර ද්‍රවිඩ භාෂාවෙන්ද ප්‍රකාශයට පත් කිරීම අරඹන ලදි.දවසින් දවස හැදී වැඩෙන සිඟිත්තකු සේ ඉතා ඉවසීමෙන් හා කල් යල් බලමින් මෙහෙවර අප ඇසුරෙහි හැදී වැඩුණි.මෙහෙවර පත්තරයෙහි පිටු අතර අකුරු වී මුද්‍රණය වූයේ ග්‍රාමීන් වංශකතාවය.එහි නියමුවන්ගේ සිට පුංචි සේවකයාගේ දහදිය කදුළු පිළිබද කතාවය. ග්‍රාමීන් ශාඛාවන් සහ ඒවායේ මෙහෙයුම් කටයුතු සිදුවන ආකාරය ගැන මෙන්ම අප ණය මුදල් ලබාගනිමින් ව්‍යාපාර පවත්වාගෙන යන සාමාජිකාවන්ගේ සාර්ථකත්වයේ අත්දැකීම් අප එකිනෙකා අතර බෙදා ගත්තෙමු. අප දන්නා අපේ මිතුරන්ගේ අප නොදන්නා ජීවිතය හා ජීවන අත්දැකීම් අප එක්නෙකා අතරේ බෙදාහදා ගත්තෙමු.ඔවුන්ගේ ජීවන සංධිස්ථාන ජයග්‍රහණ ආදියට සුබ පැතුවෙමු.ඔවුන්ගේ කුසලතාවන් එළි දැක්වීමට මෙහෙවර මඟක් කර ගත්තෙමු.මෙසේ වසරින් වසර ගෙවී යද්දී අවසානයේ මෙහෙවර තුළ අකුරු වී නිධන් ගත වනුයේ ග්‍රාමීන් අපගේ ගමන් මඟම නොවන්නේද...?

මෙහෙවර සිව්වන වසරට පා තබන මේ මොහොතේ අප කළමනාකාර අධ්‍යක්ෂකතුමන් අප වෙත තවත් යෝජනාවක් ගෙන ආවේය.,"අපි මෙහෙවර මුද්‍රණය කරලා එක පිටපත ගානෙවත් ශාඛා අතරට බෙදමු....",කවදත් පුංචි තැනින් පටන්ගෙන දැවැන්ත වෘක්ෂයන් සේ අතුපතරලා වැඩෙන අප අනෙකුත් ග්‍රාමීන් ව්‍යපෘති සේම "මෙහෙවර"ද පියවරෙන් පියවර අතුඉතිලා සුපෝෂණය වන සැටියකි.අද මෙසේ ඔබ අතට පත්වන්නේ එතුමන්ගේ එම යෝජනාවෙහි අග්‍රඵලයය.



# පොසොන් පොහොය සමරා ප්‍රයිම් ග්‍රාමීන් දන්සැල් රටපුරා

පොසොන් පොහොය නිමිතිකරගනිමින් ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ දීප ව්‍යාප්ත ශාඛා ජාලයෙහි ශාඛාවන් රැසක් දන්සැල් ගණනාවක් සංවිධානය කර තිබෙනු දක්නට ලැබුණා.එසේ දන්සැල් සංවිධානය කර තිබූ ශාඛා අතර පදවිය, මැදවච්චිය, අම්බලන්ගොඩ, නිට්ටඹුව, බලන්ගොඩ, අනුරාධපුර, අම්පාර, මීගමුව ශාඛාවන් විසින් සිය දන්සැල් පිළිබඳ ඡායාරූප මෙසේ අප වෙත එවා තිබුණා.










# ප්‍රයිම් ග්‍රාමින් කළමනාකරුවන්ට විශේෂ පුහුණු වැඩසටහනක්.

ප්‍රයිම් ග්‍රාමින් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගම සිය සේවකයින්ගේ රැකියා ජීවිතය පිළිබඳ සේම ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ ආකල්ප හා ආචාර ධර්ම වර්ධනය වෙනුවෙන්ද උනන්දුවන ආයතනයකි. මෙම ක්‍රියාවලියෙහි තවත් එක් සුවිශේෂී වැඩසටහනක් පසුගිය මැයිමස 22 දින දවස පුරා ප්‍රයිම් ග්‍රාමින් සම්මන්ත්‍රන ශාලාවේදී පවත්වන්නට යෙදිනි. ප්‍රයිම් ග්‍රාමීන් පුහුණු අංශයේ සංවිධාන දායකත්වයෙන් දිවයින පුරා විසිරි සිටින සමස්ත ප්‍රයිම් ග්‍රාමින් කළමනාකරුවන් උදෙසා සංවිධානය කරන ලද මෙම පුහුණු වැඩසහන අදියර දෙකකින් යුක්ත විය.




එදින පෙරවරු වැඩසටහන වෙන්වූයේ එදිනෙදා ජීවිතයේදී සමාජශීලි පුද්ගලයකු ලෙස පුද්ගල හමුවීම් හා බැඳුණු ආචාර සමාචාර විධි පවත්වාගැනීම, ආහාර ගැනීමේ කලාව හා බැඳුණු නූතන ක්‍රමවිධි, වැනි එදිනෙදා ජීවිතයට අත්‍යාවශ්‍ය ආචාර ධර්ම හා හැසිරීම් රටාවන් පිළිබඳව වූ ප්‍රායෝගික අවධාරනය කිරීම් වෙනුවෙනි. එම වැඩසටහන ත්‍රී අයි සොලුයුෂන්ස් පුද්ගලික සමාගමේ පුහුණු උපදේශක ගෝර්ඩන් ලෙස්ටර් අපෝන්සු මහතා විසින් පවත්වන ලදි.

පස්වරු වැඩසටහන කොළඹ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය සරත් විජේසූරිය මහතා විසින් මෙහෙයවන ලද අතර දේශනය පවත්වන ලද්දේ පෞද්ගලික ජීවිතය හා රැකියා ජීවිතය හා බැඳුණු ආචාර ධර්ම සහ සාර ධර්ම පිළිබඳ මාතෘකා කරගනිමිනි.




# "මෙහෙවර" සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

මිනිසුන් අසරණ වන්නේ කොයි මොහොතක කෙසේදැයි අප කාහට නම් කිව හැකිද...එවන් මොහොතක ඒ අසරණ මිනිසුන්හට කිසියම් හෝ අත්දමකින් සරණක් විය හැකිනම්....මෙහෙවර සත්කාර අරමුදල බිහිවන්නේ එවන් උදාර අරමුණක් පෙරදැරිවය.

ප්‍රයිම් ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබගේම ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුණු "මෙහෙවර" සත්කාර අරමුදලේ පිහිට පතමින් දිවයිනේ දසතින් අපවෙත ලැබෙන ඉල්ලීම් සිය ගණනක් අතරින් තෝරාගත් පිළිසරණ අපේක්ෂකයින් 16 දෙනෙකුට පසුගිය ජනවාරි සිට මාර්තු දක්වා මාසයන්හීදී රු. 196500/- මුදලක් ආධාර මුදල් ලබාදීමට අපි කටයුතු කළෙමු. එසේ ආධාර ලබාදුන් ආධාර ලාභීන් කිහිප දෙනකු පිළිබඳ තොරතුරු මෙසේය.



**01. බදුල්ල ශාඛාව**
සාමාජිකාවඃ- ඩබ්.එස්. මංගලිකා
ආධාර ලාභියාඃ- ඩබ්.එස්. මංගලිකා (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- දැඩි සුළඟින් සහ වර්ෂාවෙන් ව්‍යාපාරික ගොඩනැගිල්ලෙන් කොටසක් විනාශ වීම හේතුවෙන් ගොඩනැගිල්ල යළි යථා තත්වයට පත්කර ගැනීමට ආධාර මුදල ලබා දුනි.



**02. බදුල්ල ශාඛාව**
සාමාජිකාවඃ- ආර්. පුෂ්පරාණී
ආධාර ලාභියාඃ- ජේ.අශ්විනී (දුව)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**03.ගල්ගමුව ශාඛාව**
සාමාජිකාවඃ- එම්.කුසුමලතා
ආධාර ලාභියාඃ- එම්.කුසුමලතා (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**04. වැලිමඩ ශාඛාව**
සාමාජිකාවඃ- එම්.එම්. අනුලාවතී
ආධාර ලාභියාඃ- එම්.එම්. අනුලාවතී ( සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**05. මැදවච්චිය ශාඛාව**
සාමාජිකාවඃ- කේ.සුනේත්‍රා
ආධාර ලාභියාඃ- කේ.සුනේත්‍රා (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**06. මැදවච්චිය ශාඛාව**
සාමාජිකාවඃ- එස්.ජී. සිරියාවතී
ආධාර ලාභියාඃ- ජී.එච්.සුනිල් (සැමියා)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**07. කන්තලේ ශාඛාව**
සාමාජිකාවඃ- එස්.පී.එස්. මැණිකේ
ආධාර ලාභියාඃ- ඩබ්.එම්.මලීෂ(පුතා)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**08. කන්තලේ ශාඛාව**
සාමාජිකාවඃ- ජී.ආර්.දමයන්ති
ආධාර ලාභියාඃ- ජී.ආර්.දමයන්ති (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**09. බණ්ඩාරගම ශාඛාව**
සාමාජිකාවඃ- පී.මල්ලිකා
ආධාර ලාභියාඃ- පී.එස්.මධුෂාන් (පුතා)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**10.කෑගල්ල ශාඛාව**
සාමාජිකාවඃ- පී.කේ. පිල්ලේකුඹුර
ආධාර ලාභියාඃ- පී.කේ. පිල්ලේකුඹුර ( සාමාජිකාව )
ආධාර ලබාදීමට හේතුවඃ- දැඩි සුළඟින් සහ වර්ෂාවෙන් ව්‍යාපාරික ගොඩනැගිල්ලෙන් කොටසක් විනාශ වීම හේතුවෙන් ගොඩනැගිල්ල පිළිසකර කර ගැනීම සඳහා ආධාර මුදල ලබා දුනි.



**11. වැලිමඩ ශාඛාව**
සාමාජිකාවඃ- ඩී.එච්.සහීරා
ආධාර ලාභියාඃ- එන්.පී.ජෙප්රි (සැමියා)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**12. වත්තල ශාඛාව**
සාමාජිකාවඃ- අයි.එන්.සුදන්ති
ආධාර ලාභියාඃ- එච්.ඩී.මාර්කස්(සැමියා)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**13. වත්තල ශාඛාව**
සාමාජිකාවඃ- එල්.ආර්.ටී.නිර්මලා
ආධාර ලාභියාඃ- එල්.ආර්.ටී.නිර්මලා (සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**14. බදුල්ල ශාඛාව**
සාමාජිකාවඃ- ඩී.එම්.ජානකී
ආධාර ලාභියාඃ- ජී.පී.චන්ද්‍රපාල (සැමියා)
ආධාර ලබාදීමට හේතුවඃ- වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර මුදල ලබා දුනි.



**15.මන්නාරම ශාඛාව**
සාමාජිකාවඃ- ඩී.මේරි
ආධාර ලාභියාඃ- ජේ.රජිත්කුමාර් ( සැමියා )
ආධාර ලබාදීමට හේතුවඃ- පිළිකාවකට ගොදුරු වීම හේතුවෙන් ශල්‍යකර්මයක් සඳහා ආධාර මුදල ලබා දුනි.



**16.පුත්තලම ශාඛාව**
සාමාජිකාවඃ-ඩබ්.තිලකාවතී
ආධාර ලාභියාඃ- ඩබ්.තිලකාවතී ( සාමාජිකාව)
ආධාර ලබාදීමට හේතුවඃ- පාදදෙකේ යටිපතුල් ආබාධයකට ලක්වීම හේතුවෙන් රෝද පුටුවක් මිළදී ගැනීම සඳහා ආධාර මුදල ලබාදුනි.

**මෙහෙවර සත්කාර අරමුදල තව තවත් සාර්ථක කර ගැනීම සඳහා වූ ඔබගේ අදහස් සහ යෝජනා අප ඉතා අගය කරන අතර මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස් උදහස් 0710292018 යන දුරකථන අංකයෙන් සුදේශ් පෙරේරා මහතාට යොමු කරන්න.**

03 පිටුවෙන්

## ජීවිතේ කලින් දවසට...

...එයාලගේ යාළුවො ඉන්නවා වගේ හොඳ ගේක ඉන්න. අපේ ගේ දැන් තියෙන තත්වයට ලොකු කරලා හදලා මැහුම් සාප්පුව වෙනම ගෙයින් පිටතින් හදා ගන්න මට පුළුවන් වුණා. අපි මහන ඇඳුම් හුගක්ම ඇණවුම් වලටයි කරන්නේ. ඒ වගේම මනාලියන්ගේ මල් කුමාරියන්ගේ ඇඳුම්, පාසැල් නිල ඇඳුම් එහෙමත් අපි මහනවා. මේ කටයුතු සඳහා තවත් දෙන්නෙක්ට මා ලඟ රැකියා ලබා දෙන්නත් මට පුළුවන්වෙලා තියෙනවා.

ප්‍රයිම් ග්‍රාමීන් සමාගම තවත් ණය දෙන සමාගමක් කියන සිතුවිල්ල කවදාවත් අපේ හිතේ ඇති වෙන්නේ නෑ. මොකද දැන් ඒක අපේම තැනක් වෙලා. ණය මුදලක් ගත්තත් නැතත් අපි මධ්‍යස්ථානවලට නිරන්තරයෙන් සහභාගි වෙනවා. මොකද එතැනින් අපිට ආපේ ව්‍යාපාර වර්ධනය කර ගන්න අවශ්‍ය පසුබිමක් වගේම හොඳ චිත්ත ඒකාග්‍රතාවයකුත් හම්බ වෙනවා.

අද වෙනකොට මගේ පුතාලාට උගන්වලා ඔවුන් හොඳ රැකියාවන් කරන තත්වයට පත් කරලා තියෙනවා. අසනීප තත්වය තව තවත් නරක අතට හැරිලා අපිට අපේ දුවව නැතිවීමේ දුක හැරුණාම අපිට ජීවිතේ දිහා ආපහු හැරිලා බලලා සතුටු වෙන්න පුළුවන්. ග්‍රාමීන් සමාගමත් අපේ ඒ සතුටේ සැබෑම පංගුකාරයෙක්❑

**ඔබව වෙනස් කළ හැක්කේ ඔබටමය.**



# ව්‍යාපාරික කටයුතු හා බැඳි උපකාරක සේවා

17 කොටස

සංවිධානයක් සිය අරමුණු ඉටුකර ගැනීමට පිහිටුවා ඇති ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සුදුසු උපාය මාර්ග තීරණය කිරීමේ ක්‍රියාවලිය සැලසුම්කරණයයි.

සෙසු කාර්යයන්ට මඟ පෙන්වනු ලබන ප්‍රාථමික කළමනාකරණ කාර්යය වන්නේ සැලසුම්කරණයයි.

ඉලක්ක හා පරමාර්ථ සහ ඒවා ළඟා කර ගැනීමේ මාර්ග ස්ථාපිත කිරීම සැලසුම්කරණයේ අරමුණයි.


යම් කාර්යයක් හොඳින් සැලසුම් කිරීම යනු එම කාර්යය අඩක් නිම කිරීමක් ලෙස සැලකේ.

### සැලසුම්කරණය හා සෙසු කළමනාකරණ කාර්යයන් අතර මනා සම්බන්ධතාව

කළමනාකරණයේ හර (Croe) කාර්යය වන්නේ සැලසුම්කරණයයි. අනෙකුත් කළමනාකරණ කාර්යයන් ඇරඹෙන්නේ සැලසුම්කරණයෙන් පසුවයි. කළමනාකරණ විද්වතුන් සැලසුම්කරණය යන්න සංවිධානකරණය, මෙහෙයවීම, පාලනය යන දුම්රිය මැදිරි ගෙන යන දුම්රිය එංජිමකට සමාන කර ඇත.



## සැලසුම්කරණය අර්ථ දැක්වීම (Definition of Planning)




### සැලසුම්කරණය හා පුරෝකථනය

(Planning and Forecasting)

අනාගත සිදුවීම් හා ප්‍රවනතා පිළිබඳ කල්තියා නිවැරදිව අනාවරණය කිරීම පුරෝකථනය නම් වේ. එනම් ඉදිරියේදී සිදුවිය හැකි ප්‍රතිඵල න්‍යායාත්මක පදනමක් මත නිවැරදිව ප්‍රකාශ කිරීමයි. එසේ ප්‍රකාශ කළ අනාගත සිදුවීම් සඳහා පෙර සූදානම් වීම සැලසුම්කරණය ලෙස හඳුන්වයි. සැලසුම්කරණය සඳහා අවශ්‍ය කළමනාකරණ කටයුතු රැස් කර ගැනීම පුරෝකථනය මගින් සිදුවේ. ඒ අනුව පුරෝකථනය සැලසුම්කරණයේ දී උපකාරී කර ගන්නා එක් විද්‍යාත්මක ශිල්පීය ක්‍රමයකි.

### සැලසුම (Plain)

සැලසුම්කරණයේ ප්‍රතිඵලය සැලසුමයි. සැලසුම්කරණ ක්‍රියාවලිය ලිඛිත ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කළ විට එය සැලසුම ලෙස නම් කළ හැකිය. එනම් ඉලක්ක හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා භාවිතා කරන ක්‍රම සහ විධි දැක්වෙන ප්‍රකාශනයයි.

සැලැස්මක් තුළින් පිළිතුරු සපයන ප්‍රධාන ප්‍රශ්න කිහිපයකි.

1. අනාගතයේ ළඟා කර ගැනීමට අපේක්ෂා කරන්නේ කුමක්ද
2. ළඟා කර ගන්නේ කවදාද
3. අපේක්ෂිත ඉලක්ක හා පරමාර්ථ ක්‍රියාවට නංවන්නේ කොහෙදීද
4. ළඟා කර ගන්නේ කවුරුන් විසින්ද
5. ළඟා කර ගන්නේ කෙසේද
6. අවශ්‍ය සම්පත් මොනවාද

සැලසුමකින් පෙන්නුම් කරනුයේ ව්‍යාපාරයේ අනාගත කටයුතුයි. අප සිටින ස්ථානයේ සිට ගමන් කරන ස්ථානය අතර ඇති පරතරය පියවනු ලබන්නේ සැලැස්ම තුළිනි. සැලැස්ම සියළුම කාර්යයන්ට පදනම සපයයි.

ව්‍යාපාරයක් හෝ ඕනෑම කටයුත්තක් සාර්ථක කර ගැනීමට නම් සැලැස්මක් තිබිය යුතුය. සැලැස්මක් නැති නම් සියල්ල අසාර්ථක වේ. සැලැස්ම මගින් කුමක්, කෙසේ, කවදා කළ යුතුද යන්න දැක්වේ. සැලැස්මක් නැතිනම් ප්‍රතිඵල ද නැත.❑


සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරි,
ප්‍රයිම් ග්‍රාමීන්
මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්.



වපුරන්නේ නැතිව අස්වැන්න නෙලීමට බැරිය.



# 2015 ක්‍රිකට් කුසලානය කාටද...?

ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ සේවක සුබ සාධක සංගමය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරගාවලියෙහි මූලික වටයේ ප්‍රාදේශීය මට්ටමේ තරග මේ දිනවල පැවැත්වෙනවා. ප්‍රාදේශීය මට්ටමේ තරගාවලියෙන් මේ වන විට නියමිත තරග වට පවත්වා ඉන් ජය ලැබූ කණ්ඩායම් කිහිපයක ඡායාරූප අපවෙත ලැබී තිබුණා. පහතින් පළවනුයේ එසේ අපවෙත ලැබුණු ජයග්‍රාහී කණ්ඩායම් කිහිපයක ඡායාරූපය. පසුගිය වසරේදී පැවැත්වුණු සය සාමාජික ක්‍රිකට් තරගාවලියෙහි ජය හිමිවූයේ පුත්තලම කණ්ඩායමටයි. මෙවර එම කුසලානයේ අයිතිකරුවා කවුද.....?


ගම්පහ ශාඛාව


ජා-ඇල ශාඛාව


අම්පාර ශාඛාව


නගර ශාඛාව

**ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ පහත නම් සඳහන් නිළධාරීහු පසුගියදා නව තනතුරු වලට පත්වූහ. නව තනතුරු ලැබූ ඔවුන් සියළු දෙනාටම අපගේ හෘදයාංගම සුභාශිංෂණ මෙසේ පළ කරන්නෙමු.**

| නම | ශාඛාව | තනතුර |
|---|---|---|
| රුක්මාල් ජයරත්න මහතා | පොළොන්නරුව | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| නිශාන්ත ප්‍රදීප් මහතා | ගලෙන් බිඳුණුවැව | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| නිරෝෂන් රන්ගල්ල මහතා | කෑගල්ල | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| සුබ්‍රමනියම් ගුණසේගරම් මහතා | මඩකලපුව | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| ඩබ්.එම්. සුරංග මහතා | දඹුල්ල | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| ප්‍රියන්ත සුබසිංහ මහතා | නාවලපිටිය | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| ක්‍රිෂාන්ත දිසානායක මහතා | දඹුල්ල | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| ගුණරාස ප්‍රසාන්ත් මහතා | කල්මුණේ | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| ෂන්මුගලිංගම් රගුමානිවානන් මහතා | ත්‍රිකුණාමලය | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| එම්. ජෙයදාසන් මහතා | ත්‍රිකුණාමලය | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| තිළිණ ලක්මාල් මහතා | වෙන්නප්පුව | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| චතුරංග සමරවික්‍රම මහතා | වෙන්නප්පුව | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| චිරංග දයානන්ද මහතා | අවිස්සාවේල්ල | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| චමින්ද ජනක මහතා | රත්නපුර | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| සුසන්ත කරුණාරත්න මහතා | නොච්චියාගම | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| සුජිත් ප්‍රසන්න මහතා | කුලියාපිටිය | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |

## Happy Birthday

ජුනි සහ ජූලි මාසයේ උපන්දිනය සමරන ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමඟ පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| චමින්ද පුෂ්පකුමාර මහතා | ජුනි 16 | ප්‍රධාන කාර්යාලය |
| ඩිෂාන් චමින්ද මහතා | ජුනි 16 | ප්‍රධාන කාර්යාලය |
| නන්දන ජයලත් මහතා | ජුනි 17 | හලාවත |
| තේජන බණ්ඩාර මහතා | ජුනි 18 | ප්‍රධාන කාර්යාලය |
| පූලෝගනාදන් ඩිලක්ෂන් මහතා | ජුනි 18 | මන්නාරම |
| මලික් මොහොමඩ් මහතා | ජුනි 19 | අනුරාධපුර |
| චානක ගිම්හාන මහතා | ජුනි 19 | හොරණ |
| රංජන් ධර්මකීර්ති මහතා | ජුනි 20 | පුත්තලම |
| කන්දසාමි දනිස්කරන් මහතා | ජුනි 20 | කල්මුණේ |
| මොහොමඩ් ඉස්මත් මහතා | ජුනි 20 | අම්පාර |
| නුවන් සාගර මහතා | ජුනි 21 | මාතර |
| දමිත් ඉෂාර මහතා | ජුනි 21 | ගාල්ල |
| සමන් කුමාර සෙනෙවිරත්න මහතා | ජුනි 21 | මැදවච්චිය |
| නිලාන් අනුරුද්ධ මහතා | ජුනි 22 | මාතර |
| ක්‍රිෂ්මාල් සෙනෙවිරත්න මහතා | ජුනි 22 | ප්‍රධාන කාර්යාලය |
| කෝරලේගෙදර ප්‍රියන්ත මහතා | ජුනි 22 | නාවලපිටිය |
| රාසරත්නම් ප්‍රශාන්ත් මහතා | ජුනි 22 | ත්‍රිකුණාමලය |
| කේ. නිරෝචි මහතා | ජුනි 22 | වවුනියාව |
| සමීර ගයාන් හේරත් මහතා | ජුනි 23 | ප්‍රධාන කාර්යාලය |
| දර්ශික නිරෝශන් මහතා | ජුනි 23 | ප්‍රධාන කාර්යාලය |
| අමිල ප්‍රසාද් මහතා | ජුනි 23 | කඩුවෙල |
| පිලිප් හොමර් මහතා | ජුනි 24 | මන්නාරම |
| ප්‍රදීප් තිළින කුමාර මහතා | ජුනි 24 | අනුරාධපුර |
| එස් විනෝදන් මහතා | ජුනි 25 | නෙල්ලිඅඩි |
| ජනක සංජීව මහතා | ජුනි 26 | නුවර |
| චිරංග පුෂ්පනාත් මහතා | ජුනි 26 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික පුෂ්පකුමාර මහතා | ජුනි 26 | නාවලපිටිය |
| තවරාජා අනෝජන් මහතා | ජුනි 26 | කල්මුණේ |
| ඉනෝකා මධුවන්ති මෙනවිය | ජුනි 26 | කඩුවෙල |
| තරිඳු ප්‍රියසංඛ මහතා | ජුනි 26 | දඹුල්ල |
| ජනිත් සංජය මහතා | ජුනි 26 | බණ්ඩාරගම |
| රුබේරු ජයතුංග මහතා | ජුනි 27 | ප්‍රධාන කාර්යාලය |
| ජනංජය බණ්ඩාර මහතා | ජුනි 27 | නුවර |
| ආර්. සිවකාන්තන් මහතා | ජුනි 27 | මඩකලපුව |
| තාරුක ජීවන්ත මහතා | ජුනි 27 | මතුගම |
| දශිකා නුවන්ති මෙනෙවිය | ජුනි 28 | අම්බලන්ගොඩ |
| චානක කසුන් මහතා | ජුනි 28 | කුරුණෑගල |
| ඉමාන් දිනිදු මහතා | ජුනි 28 | දඹුල්ල |
| රංගන මල්ලවාරච්චි මහතා | ජුනි 29 | ප්‍රධාන කාර්යාලය |
| සුජිත් ප්‍රසන්න මහතා | ජුනි 29 | කුලියාපිටිය |
| උපුල් කුමාර මහතා | ජුනි 29 | කෑගල්ල |
| කුමාර් දර්ශන් මහතා | ජුනි 29 | මන්නාරම |
| එල්. ආනන්දරාජ් මහතා | ජුනි 29 | ත්‍රිකුණාමලය |
| සුමිත් චාමර මහතා | ජුනි 30 | ඇඹිලිපිටිය |
| චන්දිම සුජිත් මහතා | ජුනි 30 | ප්‍රධාන කාර්යාලය |
| සිවමණි කුෂාන්තන් මහතා | ජුනි 30 | මොනරාගල |
| ගනේෂ් මහේෂ් මහතා | ජූලි 1 | ප්‍රධාන කාර්යාලය |
| සඳුන් චානක මහතා | ජූලි 1 | කළුතර |
| සජිත් සුවින්දරන් මහතා | ජූලි 2 | පුත්තලම |
| සදුන් ජයමාල් මහතා | ජූලි 2 | කළුතර |
| ටී විජියකාන්ත් මහතා | ජූලි 2 | ත්‍රිකුණාමලය |
| චාමර ප්‍රියසුජීව මහතා | ජූලි 3 | අවිස්සාවේල්ල |
| සජිත් දර්ශන මහතා | ජූලි 3 | ගල්ගමුව |
| රුවන් ශාලිත මහතා | ජූලි 4 | ජාඇල |
| සිවපාලන් සින්තුජන් මහතා | ජූලි 4 | යාපනය |
| ප්‍රියලංකා බෙලිකුඹුර මෙනෙවිය | ජූලි 4 | අනුරාධපුරය |
| නිශාන්ත කුමාර මහතා | ජූලි 4 | ගල්ගමුව |
| දිමුතු ප්‍රියංකර මහතා | ජූලි 4 | හලාවත |
| ජී සුබ්‍රමනියම් මහතා | ජූලි 5 | මඩකලපුව |
| එම් ජෙයමෝහන් මහතා | ජූලි 5 | යාපනය |
| තරිඳු කොඩිකාර මහතා | ජූලි 5 | නගර ශාඛාව |
| සංඛ දිනේෂ් මහතා | ජූලි 6 | පුත්තලම |
| රසික සම්පත් මහතා | ජූලි 7 | අම්පාර |
| ධරමලිංගම් රඝු මහතා | ජූලි 7 | කල්මුනේ |
| චතුරංග බුද්ධික මහතා | ජූලි 7 | ප්‍රධාන කාර්යාලය |
| ජෙරාඩ් ලක්ෂ්මන් මහතා | ජූලි 7 | පුත්තලම |
| කැලුම් රණසිංහ මහතා | ජූලි 7 | ගාල්ල |
| බෙනඩික් ඩෙරන් මහතා | ජූලි 7 | මන්නාරම |
| ටී කන්දයියා මහතා | ජූලි 10 | කල්මුණේ |
| අබිරාමි බාලසුබ්‍රමනියම් මෙනෙවිය | ජූලි 10 | ප්‍රධාන කාර්යාලය |
| මලින්ද ප්‍රභාෂ්වර මහතා | ජූලි 10 | වත්තල |
| වී ශ්‍රීදයාබරන් මහතා | ජූලි 11 | යාපනය |
| ඉංදික අසේල මහතා | ජූලි 12 | නුවර |
| නලින් ප්‍රසාද් මහතා | ජූලි 12 | නුවරඑළිය |
| ටී නිශාන්තන් මහතා | ජූලි 12 | මඩකලපුව |
| ඉසුරු සම්පත් මහතා | ජූලි 12 | කඩුවෙල |
| සහන් ගිම්හාන මහතා | ජූලි 13 | අම්බලන්ගොඩ |
| සාලින්ද ලියනගේ මහතා | ජූලි 13 | මැදවච්චිය |
| දිනේෂ් ගැමුණු මහතා | ජූලි 14 | කෑගල්ල |
| ප්‍රදීප් අසංක මහතා | ජූලි 14 | ප්‍රධාන කාර්යාලය |
| සමීර පෙරේරා මහතා | ජූලි 14 | මීගමුව |
| ඩිලාන් නිලූක මහතා | ජූලි 15 | වෙන්නප්පුව |
| සුදේශ් රාජපක්ෂ මහතා | ජූලි 15 | ප්‍රධාන කාර්යාලය |

මෙහෙවර
ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ඃ 0112825843
ඊ-මේල් :- manjula.p@primegrameen.lk
වෙබ් :- www.primegrameen.com
අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත් (කළමනාකාර අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිළධාරි)
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කේ.ඩී. චමිල චින්තක (අර්ජුන ග්‍රැෆික්ස් (පුද්) සමාගම)
පරිඝනක අක්ෂර සංයෝජනය :- චතුරිකා මධුෂාණි
ඡායාරූප ශිල්පී :- ලක්ෂ්මන් කුමාරතුංග

**මනුෂ්‍යයකුගේ වටිනාකම දුෂ්කර දේ කිරීමෙන් වැඩිවේ.**